මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශනය

Rating 'A (lka)'
Co. Reg. No. PQ 10

ලාභාලාභ ප්‍රකාශය	2025 රු. 000	2024 රු. 000
ආදායම්	**7,904,903**	**7,582,723**
පොලී සහ සමාන ආදායම්	7,243,533	6,207,886
පොලී සහ සමාන වියදම්	(4,273,983)	(4,021,096)
ශුද්ධ පොලී ආදායම්	**2,969,550**	**2,186,790**
ගාස්තු සහ කොමිස් ආදායම්	233,879	211,880
ගාස්තු සහ කොමිස් වියදම්	(94,055)	(43,332)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම්	**139,824**	**168,548**
ශුද්ධ වෙළඳ ආදායම	782,290	804,725
ලාභ අලාභ මඟින් සාධාරණ අගයට නම්කල මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	(586,908)	257,327
වෙනත් මෙහෙයුම් ආදායම්	232,109	100,905
මුළු මෙහෙයුම් ආදායම	**3,536,865**	**3,518,295**
ණය සහ අනිකුත් වත්කම් හානිකරණය සඳහා (වෙන්කිරීම්)/ආපසු හැරවීමේ දීමනාව	111,515	46,193
ශුද්ධ මෙහෙයුම් ආදායම	**3,648,380**	**3,564,488**
සේවක මණ්ඩල පිරිවැය	(1,500,408)	(1,400,614)
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	(295,628)	(291,078)
අනෙකුත් මෙහෙයුම් වියදම්	(906,190)	(1,029,665)
මුළු මෙහෙයුම් වියදම්	**(2,702,226)**	**(2,721,357)**
මූල්‍ය සේවා මත එ.අ. මත බඳු සහ සමූහයේ සමාගම් වල ආයෝජන හානිකරණයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)	**946,154**	**843,131**
පරිපාලිත සමාගමේ ආයෝජන හානිකරණය	(29,693)	(4,435)
සමූහයේ සමාගම් වල ආයෝජන හානිකරණයට පසු මෙහෙයුම් ලාභය/(අලාභය)	**916,461**	**838,696**
මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත බදු	(405,504)	(392,787)
ආදායම් බදු වලට පෙර ලාභය/(අලාභය)	**510,957**	**445,909**
ආදායම් බදු (වියදම්)/ආපසු හැරවීම	(245,436)	(205,455)
වර්ෂයට අදාළ ලාභය/(අලාභය)	**265,522**	**240,454**
කොටසක ඉපැයීම		
කොටසක මූලික/තනුක (අලාභ)/ඉපැයුම (රු)	0.51	0.46

විස්තීර්ණ ආදායදම් ප්‍රකාශය	2025 රු. 000	2024 රු. 000
වර්ෂයට අදාළ ලාභය/(අලාභය)	**265,522**	**240,454**
අනෙකුත් විස්තිරණ ආදායම්/(වියදම්)		
ඉදිරි කාලසීමාවන්හි ලාභඅලාභ වලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්) (බදු වලට ශුද්ධ)		
සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය)	13,004	2,750
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් ශුද්ධ විස්තීරණ ආදායම්/(වියදම්)	**13,004**	**2,750**
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග නොකරනු ලබන අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්) (බදු වලට ශුද්ධ)		
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මත ජීව ගණන ලාභ/(අලාභ)	(37,644)	(45,492)
අනෙකුත් විස්තිරණ ආදායම් සංරචක වලට අදාල විලම්භිත බදු	11,293	13,648
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග නොකරනු ලබන අනෙකුත් ශුද්ධ විස්තීරණ ආදායම්/(වියදම්)	**(26,351)**	**(31,844)**
වර්ෂය සඳහා වන වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්), බදු ගෙවූ පසු	(13,347)	(29,094)
වර්ෂය සඳහා වන මුළු විස්තීරණ ආදායම්/(වියදම්), බදු ගෙවූ පසු	**252,175**	**211,360**

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය	2025 රු. 000	2024 රු. 000
වත්කම්		
මුදල් සහ මුදල් සමාන දෑ	618,703	752,190
බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු	-	203,332
ලාභ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	7,634,038	8,534,914
ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ	39,585,583	25,942,008
අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්	54	16,554
මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ	4,425,177	3,473,969
දේපල වෙළඳාම් තොගය	26,029	40,446
ආශ්‍රිතයන් හි ආයෝජන	81,084	81,084
පරිපාලිතයන් හි ආයෝජන	318,568	348,261
දේපල ආයෝජන	-	-
දේපල උපකරණ හා භාවිතයට ආයිතිය ඇති වත්කම්	1,080,743	467,355
අස්පෘශ්‍ය වත්කම්	38,374	61,329
විලම්භිත බදු වත්කම්	130,134	91,893
වෙනත් වත්කම්	449,308	186,673
මුළු වත්කම්	**54,387,795**	**40,200,008**
වගකීම්		
බැංකුවලට ගෙවිය යුතු	14,889,904	8,144,088
ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු ක්‍රමක්ෂය පිරිවැය යටතේ	31,792,758	25,956,175
නිකුත් කල ණය හා අනෙකුත් ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ	1,821,393	730,033
වර්තමාන බදු වගකීම්	166,186	209,437
අනෙකුත් වගකීම්	1,159,257	895,070
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	424,091	383,174
මුළු වගකීම්	**50,253,589**	**36,317,977**
හිමිකම්		
ප්‍රකාශිත ප්‍රාග්ධන	4,276,448	4,276,448
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	450,501	392,265
රඳවා ගත් ඉපැයුම්	(1,011,105)	(1,189,204)
RLA සංචිත	418,362	424,622
OCI සංචිත	-	(22,100)
මුළු හිමිකම්	**4,134,206**	**3,882,031**
මුළු වගකීම් සහ හිමිකම්	**54,387,795**	**40,200,008**
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	61,624	48,858
කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.)	7.88	7.40

තෝරාගත් කාර්ය සාධක දර්ශක	2024/12/31 දිනට (විගණනය නොකළ)	2023/12/31 දිනට (විගණනය නොකළ)
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව		
මූලික ප්‍රාග්ධනය (පළමු පෙල ප්‍රාග්ධනය), රු.000	3,379,195	3,079,961
මුළු ප්‍රාග්ධනය, රු.000	4,943,210	3,719,619
අවදානම මත බර තැබූ වත්කම් මත මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය% (අවම අවශ්‍යතාව, 8.5%)	9.10%	11.97%
අවදානම මත බර තැබූ සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය% (අවම අවශ්‍යතාව, 12.5%)	13.31%	14.45%
ප්‍රාග්ධන අරමුදලට තැන්පත් වගකීම් අනුපාතය (අවම අවශ්‍යතාවය, 10%)	19.87%	16.02%
වත්කම්වල ගුණත්වය (ණය කළඹේ තත්වය)		
දළ අක්‍රීය ණය, රු.000	3,190,380	3,990,711
දළ අක්‍රීය ණය අනුපාතය %	7.39%	14.07%
ශුද්ධ අක්‍රීය ණය අනුපාතය %	2.41%	4.08%
ලාභදායිත්වය (%)		
පොලී ආන්තිකය	6.63%	6.52%
වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර)	1.08%	1.21%
හිමිකම් මත ප්‍රතිලාභය (බදු පසු)	6.62%	6.37%
නියාමන ද්‍රවශීලතාවය (රු. 000)		
අවශ්‍ය අවම ද්‍රවශිල වත්කම් ප්‍රමාණය	3,696,294	3,172,545
පවත්නා ද්‍රවශිල වත්කම් ප්‍රමාණය	4,472,364	9,697,514
අවශ්‍ය අවම රජයේ සුරැකුම්පත් ප්‍රමාණය	2,206,919	1,945,408
පවත්නා රජයේ සුරැකුම්පත් ප්‍රමාණය	3,760,381	2,991,310
නාමික තොරතුරු		
සේවක සංඛ්‍යාව	900	870
ශාඛා සංඛ්‍යාව	47	47

සහතික කිරීම

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඒල්සී හි ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන විධායක නිලධාරි සහ අනුකූලතා නිලධාරි වශයෙන් පහත අත්සන් තබන අපි:

(අ) ඉහත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද ආකෘතීන් හා නිර්වචන වලට අනුව පිළියෙල කර ඇති බවත්,

(ආ) මෙම ප්‍රකාශයෙන් හි අඩංගු තොරතුරු උපුටාගෙන ඇත්තේ ලියාපදිංචි කල මූල්‍ය සමාගමේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලිනි. නො එසේ නම් ''විගණනය නොකළ'' බව සඳහන් කර ඇත.

(අත්සන් කළේ)	(අත්සන් කළේ)	(අත්සන් කළේ)
ඒ සී පි ඒකනායක	**එච් කේ ඩී ඩබ්ලිව් එම් ඩී කේ හපුහින්න**	**ඩී එම් එස් පී බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරි	ප්‍රධාන විධායක නිලධාරි	අනුකූලතා නිලධාරි
27 මාර්තු 2026	**27 මාර්තු 2026**	**27 මාර්තු 2026**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/H/BOC-S/MBSL/FA/2025/06
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 27 March 2026

සභාපති
මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිතයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව සංශෝධිත 2018, අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සි ("සමාගම") සහ එහි පරිපාලිතයේ ("සමූහය") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා ඒවායේ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු නම්, මාගේ වෘත්තීය විනිශ්චය අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ දී වඩාත් වැදගත් වූ කරුණු වේ. සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන රාමුව තුළ එම කරුණු ආමන්ත්‍රණය කරන ලද අතර, ඒ පිළිබඳව මාගේ මතය සැකසීමේදී, මෙම කරුණු පිළිබඳව වෙනම මතයක් ඉදිරිපත් නොකරමි.පහත සෑම කරුණක් සඳහාම, මාගේ විගණනය විසින් මෙම කාරණය ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳ මාගේ විස්තරය එම රාමුව තුළ සපයා ඇත.

මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන අංශයේ විගණනය සඳහා විගණකවරයාගේ වගකීම් විස්තර කර ඇති අතර එම වගකීම්, මෙම කරුණුවලට අදාළව මම ඉටු කර ඇත්තෙමි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම පිළිබඳ මාගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියා පටිපාටිවල කාර්ය සාධනය මාගේ විගණනයට ඇතුළත් විය. මාගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, පහත සඳහන් කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ මාගේ විගණන මතය සඳහා පදනම සපයයි.

ප්‍රධාන විගණන කාරණය

ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනිනු ලබයි.

සටහන 23 හි දක්වා ඇති පරිදි ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මැනීම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3.5.11 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

මෙය ප්‍රධාන විගණන කාරණයක් වීමට හේතු වන්නේ

- ණය සහ අත්තිකාරම් වල අනාගත අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීමේදී සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු සම්බන්ධ වූ අවිනිශ්චිතතාව; සහ
- අපේක්ෂිත ණය පාඩු සඳහා වාර්තා කරන ලද දීමනා ප්‍රමාණයේ ප්‍රමාණාත්මකභාවය.

අපේක්ෂිත ණය පාඩු සඳහා වන හානිකරණය තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම, ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික යෙදවුම් පුළුල් පරාසයක් භාවිතා කිරීම සහ ඒවායේ ආශ්‍රිත බර තැබීම් ඇතුළත් වන අතර ඒවා සහජයෙන්ම ඉහළ යන ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ සහ ආත්මීයත්වයේ මට්ටම්වලට යටත් වේ.

ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන් පිළිබඳ වැඩිදුර තොරතුරු සටහන් 3.5.11 හි අනාවරණය කර ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්ට අදාළ තොරතුරු තාක්ෂණ (IT) පද්ධති

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය ක්‍රියාවලීන් සහ අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලබන්නේ තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමිනි. ඒවා පැතුරුම්පත් (spreadsheets) භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත.
ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඒ ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස හඳුනා ගන්නා ලදී.

මාගේ විගණනය ප්‍රධාන විගණන කාරණය ආමන්ත්‍රණය කළ ආකාරය

ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනින ලද ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩු සඳහා දීමනා ආමන්ත්‍රණය කිරීමේදී, මාගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය:

- මාගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත හැකි හොඳම තොරතුරු මත පදනම්ව, අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් සඳහා සමාගමේ දීමනා සමග පාදක ක්‍රමවේදය සහ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ පෙළගැස්වීම තක්සේරු කරන ලදී.
- අපේක්ෂිත ණය පාඩු ඇස්තමේන්තු කිරීම මත පාලනයන්හි සැලසුම්, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කරන ලදී.
- මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ණය පාඩු, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා දීමනා අධීක්ෂණය, සමාලෝචනය සහ අනුමත කිරීමේ මට්ටම තක්සේරු කරන ලදී.
- සමාගමේ අදාළ මූලාශ්‍ර ලේඛන සහ ගිණුම් වාර්තා වල විස්තර සමග එකඟ වීමෙන්, අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් වලදී භාවිතා කරන ලද පාදක දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය සහ සාධාරණත්වය පරීක්ෂා කරන ලදී.
- ණය තත්ත්ව තක්සේරු කිරීම් සහ අදාළ අදියර වර්ගීකරණයන්හි භාවිතා කළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධකවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී.
- ඉහත කරුණු වලට අමතරව, පහත ක්‍රියා පටිපාටි සිදු කරන ලදී:
- **හානිකරණ සඳහා තනි පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ අත්තිකාරම් සඳහා:**
- අපේක්ෂිත ණය පාඩු සඳහා දීමනා වෙනුවෙන් භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම්වල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. එවැනි ඇගයීම් සිදු කරන ලද්දේ, විශේෂයෙන් ඉහළ අවදානම් සහිත කර්මාන්තවලට අදාළ මුදල් ප්‍රවාහ පුරෝකථනයන්හි වටිනාකම සහ කාල නියමයන් සහ ඇපකරවල අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල තත්ත්වය සැලකිල්ලට ගනිමිනි.
- තනි හානිකරණ ගණනය කිරීම් වල අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී.
- **හානිකරණ සඳහා සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ අත්තිකාරම් සඳහා:**
- අපේක්ෂිත ණය පාඩු සඳහා දීමනාවේදී භාවිතා කළ ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී.
- ECL දීමනාවට අදාළව කළමනාකරණය විසින් සලකා බලන ඕනෑම දෙයක් ඇතුළුව, පාදක කරගත් ක්‍රමවේදය තුළ කළමනාකරණය විසින් භාවිතා කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල සාධාරණත්වය තක්සේරු කරන ලදී.
- මාගේ පරීක්ෂණයට භාවිතා කරන ලද ඉදිරි දැක්මක් සහිත තොරතුරුවල සාධාරණත්වය ඇගයීම, සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එක් එක් අවස්ථාවට පවරා ඇති සම්භාවිතා බර තැබීම ඇතුළත් විය.

3.5.11, 23 සහ 48.2 සටහන්වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කළෙමි.

මාගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය:

- ක්‍රියාවලිවල අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර මූල්‍ය වාර්තාකරණය සහ අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධ අදාළ පාලනයන් පරීක්ෂා කරන ලදී.
- මාගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ කර ගත් අතර;
- පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයට අදාළ ඒවා ඇතුළුව, තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනවල සැලසුම් සහ මෙහෙයුම් ඵලදායිතාව හඳුනාගෙන, ඇගයීමට ලක් කර සහ පරීක්ෂා කරන ලදී.
- සමාගමට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මූලික වශයෙන් විමර්ශනය තුළින් මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- සාමාන්‍ය ලෙජර් සැසඳුම් සමාලෝචනය ඇතුළුව, නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කරන ලදී.

1.4 2025 සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

වාර්ෂික වාර්තාව මම කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගම සහ සමූහය විසින් ස්වකීය මුළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකතාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලද